චක්‍රලේඛ අංක:- 01/2005

මගේ අංකය:- බඳ/සසේකො/ලේ/තිර
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2005.01.05

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා,
සමුපකාර සමිති, දිස්ත්‍රික් බැංකු සංගම්
හා සමුපකාර ණය දෙන සමිතිවල,
සභාපතිවරුන් වෙත,

මහත්මයාණෙනි,

**සමුපකාර සේවකයන්ට අතුරු දීමනා ගෙවීමේදී ඒ යටතේ**
**පාරිතෝෂික මුදල් ආදිය ගණනය කිරීම**

මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 4/2001 දරණ 2001.11.27 දිනැති චක්‍රලේඛයට වැඩිදුරටයි.

02. ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් විවිධ අවස්ථාවලදී යම් යම් සමිතිවලට කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දෙනු ලබන උපදෙස් සහ කොමිෂන් සභාව විසින් ගෙන ඇති තීරණ අතර ගැටුම් සහගත තත්ත්වයක් පවතින බවක් කොමිෂන් සභාව වෙත ලැබෙන තොරතුරු අනුව පෙනී ගොස් ඇත. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි ක්‍රියා කිරීම කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

1983 අංක 12 දරණ පාරිතෝෂික පනත හා ඉන් පසු එම ...ට කරන ලද සංශෝධන කිසිවක් 1975 අංක 05 දරණ සමුපකාර පනත යටතේ ...පදිංචි කරන ලද සමුපකාර සමිති වෙත බල නොපාන බව කම්කරු කොමසාරිස්වරයා ගේ ද නිගමනය වේ. එබැවින් ඉහත සඳහන් පාරිතෝෂික පනත අනුව සමුපකාර සමිති විසින් ක්‍රියා කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

04. තවත් ගැටළුවක් ලෙස පැන නැගෙන්නේ වැටුපට අමතරව දීමනා ගෙවීමේදී එම දීමනා පාරිතෝෂික අරමුදල් හා අදාල ද යන්න පිළිබඳ පවතින තත්ත්වයේ අපැහැදිලි බවයි. පාරිතෝෂික මුදල්, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් ගණනය කිරීම සඳහා අතුරු දීමනා අදාල නොවන බව ද දන්වා සිටින අතර, 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත හා ඉන් පසු නිකුත් වී ඇති ඉහත සඳහන් කරුණු වලට අදාල අණපනත්වල නියමයන් සමුපකාර සේ...ාට අදාල නොවන බව ද කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.